# සැළලිහිණි සන්දේශය.

තොටගමුවේ

විජයබාහුපරිවෙණාධිපති

ෂඩ්භාෂාපරමේශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය

**ශ්‍රී රාහුල සංඝරාජ**

මහාස්වාමිපාදයන්වහන්සේ

විසින්

විරචිතයි.




ඩබ්ලිව්. ජ්. පෙරේරා

විසින්

**විද්‍යාසාගර යන්ත්‍රාලයෙහි**

මුද්‍රණයකරවනලදි.

1901.

# SELALIHINI SANDESA

EDITED BY

Shadbasha Parameswara

THRIPITAKA WAGISWARACHARY

Rt: Revd: **SRI RAHULA SANGHARAJA**

PRINCIPALE OF

Wijayabahu Piriwena

**TOTAGAMUWA**

---

PRINTED BY

**W. E. PERERA**

*at*

WIDYASAGARA PRESS

*Wellampitiya.*

**1901.**

# සාරිකා සන්දේශය.

ප්‍රසිද්ධානන්‍යකීකෘත්‍ය-පුරුෂාඛ්‍යාර්ථයොෂිතඃ
සන්දේශංප්‍රේෂයෙද්විද්වාන්-දූතෛර්හංසාදිභිශ්ශුභෛඃ.

ඉතිහාසකථාපූර්-මාශීඃපූර්වමථාපිවා,
දූතන්තුවර්ණයෙද්දෙශ-කුශලප්‍රශ්නපූර්වකම්.

වර්ණනානන්තරං තස්‍ය-ගන්තව්‍යස්ථාන කීර්තනම්
පශ්චාත්තත්‍රවෙශ්‍රාෂ්‍යසීතත්‍යක්ත්වා-මාර්ගදෙශාදිවර්ණයෙත්.

තත්සන්දෙශනගරී-නායකානාංගුණස්තුතිඃ
තතොවෘත්තාන්තකථනං-දූතස්‍යාශීර්වචඃපරම්.

යනාදි දූතකාව්‍යලක්ෂණයෙන් යුක්තවූ විභීෂණ දෙවිරජහු දූක වරප්‍රාර්ථනාවක් කිරීම කථාශරීර කොට ඇත්තාවූ සන්දේශයක් සාරිකාපක්ෂීහු දූතක්‍රියාවෙහි යොදා රචනාකරනු කැමැත්තාවූ, සංස්කෘත ප්‍රාකෘත, මාගධ, අපභ්‍රංශ, පෛශාචි, ශෞරසේනි යන ෂඩ්භාෂා කවිත්වයෙහි සමර්ථවූ ශ්‍රීසඞ්ඝබොධි විජයබාහුපරිවෙණාධිපති ශ්‍රීරාහුල ස්වාමිපාදයෝ ත්‍රිවිධ කාව්‍යමුඛයන් අතුරෙන් ආශීර්වාද පුරස්සරකොට "සැරද සුලකළඹුරු" යනාදි කව කීහු.

මෙහි පූර්වාර්ධයෙන්:-

ස්වරාමෘතෙනොපජගුශ්ච සාරිකා,
සනාථෛව තත් පෞරුෂගායනී කෘතා.'ඝී''

නෛෂධකාව්‍යයෙහි කීහෙයින් සියලුපක්ෂීන් අතුරෙන් මධුරවචනයෙන් ප්‍රසිද්ධවූ සාරිකාපක්ෂිරාජයාට එම විද්‍යමානවූ නෛසර්ගික ගුණයෙන් සතුති කළහ.

අපරඞීයෙන්:-

ත්‍රිකෝණමෝඝුඃ කම්තරවිමූර්ජගුඃ
කලම්බිකා පක්‍ෂව්ම්වුක්‍ෂ්වුවක්‍ෂවඃ,
ගෘහාඞ්ගනා චඤ්චරණෙ මාජ්‍ජාරා
චමෝහරා යත්‍ර වධූර් ස සාරිකා,ඕ.

ශ්‍රීඝනනාදන කාව්‍යයෙහි කිහෙඝින්ද, වාසවදත්තාකාව්‍යයෙහි සාරිකාපක්‍ෂීහු ලවා සන්දේශපත්‍ර යවා වාසවදත්තාවගේ මනොරථසිද්ධිය වූයේය යනු පෙණෙන හෙයින්ද, මේ පක්‍ෂිරාජයා රහස්‍ය සම්භාෂණයෙහි සමර්ථබැව් ප්‍රථමකොට කීමෙන් තදනුබද්ධ කාවූ දූතක්‍රියාවද එහිව අනාගීත හෙයින් මේ පක්‍ෂීහු රාජකුලයට දූතාමාත්‍යයන් බඳු බුද්ධියෙන් යුක්තයයි සර්වාකාරජනකගුණවිශේෂයෙන් ස්තුතිකළහ—මේ මෙහි සමුදායාර්ථයි.

——



# සැළලිහිණි සන්දේශය.

1. සැරද සුලකලකුරු-මියුරු තෙපලෙන් රඳනා,
රුජකුල රහසැ මැතිනිය-සියතිහි සැළලිහිණිසඳ.

2. පුණ් මල්කෙසරු මෙන්-රන්වණි තෙල සරණයුග
සපුමල්කැනෙව් තුඩ මද රතිනි මනහ     ර
නිල්පුල්දෙලෙව් සම්වණි පිය පියපත     ර
මලින් කළ රූ එව්-එබැවින් නුබින් එන වර
නි ලූ ද  ලදසිඳුබුවො දිගුවරලැ නි     ලූ
නි ලූ ද  වට බිගුපෙළ අද නඹරනි     ලූ
ව  න දෙව්ලියෝ නොකලොද සවණ අබර ණ
එ  න මග දුකෙක් නොවීද සබඳිනි කල  ණ
සෙනෙ හසබැඳුනු තැනැ නොහරිණ කරුදිවුණ
වෙ  න සැප කුමට තොප දකිනා එම පම  ණ

3. ල  ප නොමවන් සඳ මෙන් සොම්ගුණ ගිහි  ණි
ඔ  ප වැඩි ගත හෙල්මැලි සිවුමැලි පැමි  ණි
සැ  ප සිරි දෙන වැනි රසබසැති සිතුම්  ණි
තොප දූකුමෙන් අප පින් කළ බව දැනු  ණි

4. මී තු රැකුමෝ දුක්සැප දෙකෙහිම පැව  ති
බි තු සිතුයම් රූමෙන් පිටු නොපාවි  ති
යු තු මතු වැඩ මතෙපල එවැනි ගුණ ඇ  ති
සි තු නතුකරු අස යහලුව වඩන රූ  ති

5. ප වී රද කඳ නාලෝ මුල් දිගතු බ ර
ලෙ වී තුරු සුසැදු යස මිණිමුතු මල්පත ර
ස වී සිරි පිරි සුරපුර වන් කැලණිපු ර
දෙ වී මෙහසුන් විබිසණසුරිඳුට පව ර

6. ග න ව න් මිසුරු නද දෙන ගුවන වන් වි ට
වි ල සි න් මෙමා කරවන මිදුරෙ මන්තු ට
එ හ සු න් පැසුලු පවසම් රස තුසුන් කො ට
අ ස දූ න් ත යන මග සලකුණු මෙතැන්සි ට

7. පොහොසද්ද න ඇති තුණුරුවනැ බැතිපෙ මා
මු ලු ව ද්ද න සුර පුර පිරි සිරින් හැ මා
ජ ය ව ද්ද න කෙරුමෙන් සුසැදි තමනා මා
ජ ය ව ද්ද න පුරවර දනු මිතුරුතු මා

8. සැදි රතනඹරපෙළ රණතිසරුන් රුවැ ති
පි දි දියදහර ලෙලදෙන දිගු නරුපවැ ති
රැඳි රළරැළැති හොය දියවන්නා නමැ ති
ඇඳි පුරඅඟන පටසළු සිරි රුපැයි නි හි

9. ස ම න ළ මුහුළ මහසමුදුර මෙවුල්බ ර
සු ල ක ළ පුවළ ලකඟන සිරි යොවුන් ම ර
ත ර ක ළ විසල් වාසල් යතුරු මෙනුව ර
බැඳැ හ ළ රුවන් තනපට කියලිය පවු ර

10. සි හි ල් සපු සුවඳ ගෙණැ එන උයන්ව ළ
සි සි ල් නෙලෙන් හඩවන මිණි කිඟිණිකැ ළ
වී පු ල් රත්සෙමෙර බඳ රන් දද සස ළ
ලකා ල් මෙපුර තුළ වලහා රිවිතැවි ළ

11. ත ර සර ගිවි මහල් මෙහි පහපෙළ නිතො ර
සු ර සිදු විදුදරන් සැදි සඳලු මනහ ර
කා ර වන මගුල්කෙළියෙන් නොමැති අවස ර
සූ ර සිරි බලනලෙස බට සුරවිවන් පු ර

12. ඝ සි වන උවන ඉඟ සුග ගනහැකි මිටි න
නි සි පුළුලුකුල රියසක යුරු නිසරත න
දි සි රණලිසෙවි රුසිරි යුත් මෙපුරග න
ඇ සි පියහෙලන පමිණින් නොවෙතිදෙව්ග න

13. සොඳුරු සිඹු නදන් අනතුරුදෙසැ සිටි න
කි නුරු නිස්සරන් කදහස වෙත නොව න
ඉ සු රු දනද සිය නිකෙලෙස් තැනැ රඳ න
උ තු රු දිගිඳු පුර දිනි මෙපුර වැජඹෙ න

14. උ දේ සැපත් සුරගුරු අලුකරු අව ට
ඕ දේ මුදුන්වත අස්විද නැකතැ සි ට
ඍ දේ සිහින් තම කුලදෙවිය සිහිකො ට
යෙදේ ගමන් යහලුව මෙපුරෙන් නොප ට

15. නල මුදු සුවඳ පිරිකුඹු මියුරු අඹගෙ ඩි
පු ල හෙළකුසුම ලිය පියතෙපල රන්කෙ ඩි
ස ල සුදුසෙමෙර සේසත් ගිජිඳුනොදවැ ඩි
බ ල සුබනිමිති පෙරමගැ නැකතනටත් වැ ඩි

16. ලො වැ විහි ද සුදුපැහැ සඳරුසෙව් සැ දි
දෙනනොම ද සිරි සගමොක් සැප නිසැ දී
ල ද මු නි ඳ දම්කඳ පහස මනබැ දී
ච ඳු ද ළ ද හිමි තෙමහල් පහසැ රු දී

17. ගන ර න් කොතින් දිලිහෙන මිණිරැස් විහි දු
පව නි න් ලෙලෙන පලඅග මුතුලැල් සිනි දූ
සඳකැ න් මිණෙන් බඳ රුදු බිතුපෙළින් රු දූ
එතැනින් ගොසින් සැණෙකින් රජවිමන් ව දු

18. රි වි බි ඹබා යුරු රිවිකුල කමලක ර
පි යු ම ඹිබා නිතරම රුදි උරමැදු ර
මෙනරම්බා හිමි රුසිරිනි මනහ ර
පැරකුම් බා නරනිඳුසඳ දකු මිතු ර

19. උ නු නොව බරණ සිවුඈට ඔවුනුන් පැල ඳ
වෙනු මෙන් පසක් උන්සඳ සිංහසුන් මැ ඳ
ම නු රජකුලෙන් පැවයෙන පිට්‍රවෙළ නොසිඳ
ග නු අවසරය එතිරිඳු සිරිපතුල් වැ ඳ

20. පෙරව සඳකිරණ පිපි කුමුදුමල් ව ටි න්
ප ර ව තඹරපෙති ගිලි දියතලා පි ටි න්
ත ර ව සිහි ඇතිව පරතෙරට යන අ ටි න්
සා ර ව පියාසර සකි කොන්නගංතො ටි න්

21. ක ලු වැ ල් කපුරු දුමතුළ ලෙලෙන දදපෙ ළු
සු වි ස ල් මිහිඟු සක්සන් මිණිහඬ වත ළ
කරළ ලොල් සතන් පවසන තියුහී දෙම ළ
ම න ක ල් ඉසුරුකෝවිලැ ලඟිනේ ලක ළ

22. වෙ ස ඟන තුඟු තනයුග රෙන් කොකුමග ර
පි ස එන මදපවන්හැඳ විල්ලිහිණිස ර
ගො ස අලුයම් පසතුරු සවණතෙහි ක ර
ඇ ස නිදිගැට හැරළ නැගිසිටු උදෙහි ර

23. උ දු ගිරි කසුන්රිවිවැට හිසැ බැබ ළී
එ දු සහසකර පහනෙව් කරත හෙ ළී
යොදු නුවන් ඉසුරුට කරණ පුදකෙ ළී
වි දු පියා නිලඹර යන් නොවී මැ ළී

24. සු ර ර ද සමන් සමයින් සුරඟන එව ර
පැහැනද මදුරු පරසතු මල්පත ර
ක ර පු ද වඳින රුදි මුනි සිරිපාතඹ ර
ස කි ස ද පෙණේ සමනලගල නැගෙනහි ර

25. ග නේ මිණි බැබළි කිරණෙව් සත පා ය
ර නේ යටග සැවුලිදුදද ගළ පා ශ
අ නේ ළකළකළපුර අප නර පා ය
පෙනේ දකුණැ මහසෙන් දෙව්රද පා ශ

26\. ව ල දින අඳහසින් මෙන් සුරගඟ අඟ න
නා ල බල සසල දළ රළපෙළ නුබ නැගෙ න
වෙ ල ලසැ ගැවසි මුතු සක් පබලු බබළ න
බ ල මහමුහුද එවසඳ උතුරෙන් පෙනෙ න්

27\. ස න් න න් සිහින්ගෙඳි සෙවනැලුවැලිතෙලෙ
තැ න් තැ න් වලම සැතපී සිඹුමැලි බැවි න
ර න් ව න් කරල් ගෙණැ එන ගිරවුන් අතින
ය න් ම න් තොසින් මග තොරතුරු නියම දූ

28\. නීල තුරඟුට් නැගෙමින් රිවිදෙවි සිරි න
ඳු ල කරඨ සේසත් මිණිබරණ කිරණි න
ඹ ල පිරිසෙන් සහ යාපාපටුන් ගෙ. ණ
බ ල සේනානායක සපුකුමරු එ න

29\. අ ශ පිපි මල් මලිනියලිය කැ ලේ යා
ව ග බැඳ ගොනා රජහස පුල්වි ලේ යා
ල ඟ සිටි තුරු ගිළිහුනු රොණවු ලේ යා
ම ග බැස යව පළ ගෙළ වැලිතෙ ලේ යා

30\. අ සි රාවණ උවත් නවතාන රිසින් එ න
අ සි රාදහස් දිලි දුනු කොත් සිපත් ගෙ ණ
කා සි කාවලෙහි දූකැ සෙබළුන් රැකැ සිටි න
ව සි යාකාරයන් මල්තුරුගණ වනගිසි න

31\. නිම ල් සඳපහන් වැනි වැලිපිට උඩු ල
සුපු ල් මල්යහන් ලියමඬු ලියගෙපෙ ල
එක ල් කෙළින වනදෙව්ළිය දූකා කොම ල
ලස ල් රුකොකෑ සැතපෙම ලපලු සිනිල ල

32\. ම ල් ද මි සුවඳදුම් දුන් සොඳ වරල සි නි
ක ල් ගි මි නිවා සැනගෙන සිහිලසර සි නි
කොල් ල මි ගසින් නිල්ඉවුරැති පොකුණ සි නි
ව ල් ල මී බලම දූකා යාගත් සහතො සි නී

33. කස්තුරිතිලක සැදි නලලත සුමු   වා න
පුල් රතුඋපුල් මල්දම් හිසැ දව   වා න
සළෙලුන් යනෙන නිති කරළ කෙළිකව   වා න
රිවිමුදුනනෙහි එන මැද වදු සුමු   වා න

34. ම ග නිල මින් සිපි නා දෙඹ නී පිය   ල
පි ය ස ල මින් මල ගෙහි කෙළැ රොණිනව   ල
නතු ඩ ල මින් බිදැ විලිකුම් මියුරුප   ල
ඉ සු ඹු ල මින් යා සැළ දඹපඳුරුව   ල

35. රි වි තැ වු ලේ පිපි කමලේ විල් ගැව   සී
ම න සොවු ලේ තුරුවදලේ හඩන නි   සී
ව න සැ වු ලේ මග අසලේ පොර සැල   සී
ගු රු බැ වු ලේ යව අවුලේ නොවී කි   සී

36. ව න සි රි පිනුම්රා බඳ රණබරණ යු   රු
ව ට පි රි සුපුල් දුනුකෝ මල්මුරුත තු   රු
බි ගු පි රි වැරූ ඔලුපුලැඹුලවල තඹු   රු
හි ම ස රි සිනිල් දියහෙබ දූකැ යන් මිතු   රු

37. ස ලා දු ලා පියයුරු නඹර රොන් ර   න
පු ලා නිලා උපුලන් ලාගෙණැ කණ   න
කලා පි ළා නොවැ ඇල්ගෙවි කෙළින ඉ   න
බ ලා ප ලා යව අස්වන් ගුරුළුකෙ   න

38. බ න් නේ මරාම්ණී දුල පබළු මුතුප   ට
වැ න් නේ ගම්බු ගෙළෙ පලවල් කුමුකුව   ට
ග න් නේ නසිත එබැවින් නොවැදූ කෙළියට
ය න් නේ වෙළඳගොඩ දූකැ මදකලක් සි   ට

39. අවට සුපිපි සපු දුනුකෝ සල   ළා න
කඩන නැනින්නැන විලිකුළු කිර   ළා න
පැසි නැම් කරල් රත්හැල් සහ   ළා න
වඩිනා මැ නාවි මහවෙල මැද මෙර   ළා න

40. ප ත් ගන පුල්මල් දෙඹතුරෙකැ පියක රැ
සි ත් පිණවා ඉඳැ සැළලිහිණින් අතු රැ
ග ත් සරතැස හැරැ විඳැ සුවඳමඳම රැ
කි ත් සිරිමේ වෙහෙරට වදුව පස්ට රැ

41. සොඳ බුහිරද පිඹුකළ යස මෙරද ස ම
පු ද කළ ඔහු නෙත් නිල්කැලුමෙව් බැර ම
ස ඳ හුරු සඳවෙල රැඳි රුසිරි මනර ම
ව ඳ නෙඟි තෝ දගැප් මහබෝ පිළි ම

42. ස ල් සපු කිණ දෙඹ රැරඟ නා මිදෙ ලී
පු ල් එරහැදි හෝපලු මිඅඹ පලො ලී
පොල් පුවකිඟු රඹ මලබුලනි සලිම ලී
නි ල් ගණසා සෙවනලු දෙතොර මනක ලී

43. හ ව සා සුපුල් කඩුපුල්මල් නිල් වර ල
ස ල සා උකුල වට රසුදුල මිණිමෙවු ල
ස ක සා දෙතන හරසඳුනෙත් කරැ සිසි ල
දෙප සා ඉසින නිල්පැහැ නෙත් දිගුපුළු ල

44. ම නා හර නාමෙණෙව්යනිදැ ලවැලිපි ට
ගෙනා මිණිවෙණ තන් නියගින් මැදූ රුව ට
ක ණ හෙවැ ගයන බුදුගුණ ගී මියුරැකො ට
සැ න හෙව කැලණිගඟබඩ මදකලක් සි ට

45. ස පු ම ල් යොහොඹු ලා බැඳැ වරල මනර ග
පැහැදු ල් දෙඹකැකුළු හරකර ලාතන ශ
රෙණවු ල් නාකුසුම් කණ ලා කොඩොල් ර ග
ද හ ව ල් උයන්කෙළි කෙළැ සලෙලුන් සමග

46. තු ම නි ත් නිල්උපුල් මදහසිනි හෙළැඹු ල
උ ම නි ත් කමල් පැ ලවණතිනි රතුපු ල
ප ව නි ත් අඹළ රණලිය වන් ලියන්කැ ල
රු ව නී ත් ළකළ ශඟදිය කෙළැ නිමුණු කල

47. වදිමින් සවසනල හැසිරෙණ දිගතුව ල
සොබමන් සුනිල් මිණි නිල් නුබතුරු විපු ල
පතසන් අඹරගිර නැටිඹයන් වැටෙනක ල
විලිකුන් සුරත් පල වැනි වේ රිවිමඬ ල

48. මහතුන් හසළ තමනඹ යස පිළිටලෙ ස
නියතින් නොහළ ශුතුබව පැමිණෙණ වෙශෙෂ
සුදනන් පැවති සිරිතැයි දන්වනා විල ස
නුබවින් සමග ගෙවුනෙය දහවල් දව ස

49. සැදෑ ලෙන් වරුණදෙව්රද මුහුදූ වි සූ
ස දෑ සහසකර එනා මහවත සැල සූ
වි දෑ උපුල් පිළ මෙන් රත්පටින් වැ සූ
සැදෑ වලාපෙළ පැලදිගැ පෙණුනු ප සූ

50. උදුල සොම්කැලුම් තිසයුරුහිමි පුව ළ
පහළ වන බැවින් තමවෙත නිසඹුදෙ ළ
ලකළ ගුවන්තල සිරියහනැ නිකස ළ
අතුළ කුසුම් විලසින් සැදෙත තුරුවැ ළ

51. දනකැන් ගෙණැදමනගොදුරටනොහැකි ළිය
පනිමින් දියෙන් ඔවුනොවුනැ ගෙහිපෙර ළිය
ලෙහෙළුන් කෙළින කරු පෙණපිඩු රළරු ළිය
එතනින් පියාසරකරුදකු මස්කෙ ළිය

52. පැහැසර ණිය මිණි පැමි ණිය කොත් අගට
බඳ කිකි ණිය ද ද ගිහි ණිය විමන්ව ට
නොවපැර ණිය ව්‍යා රම ණිය විපින් වී ට
සැළලිහි ණිය වදු කැල ණිය පුරවර ට

53. දියකද ගැඹර පිරි පූවතර මහසපු ර
මුවරද ලෙසින් වන අගනිසි සාරතඹ ර
මනනද කරණ මිණිගණ මෙන් දිසි එම ර
ගැහැනද පහන් එණි මහාවී බල මිතු ර

54. උ ද ය ග පියුම්රු පැහැවැදූ මෙන් රුදු නු
පෙ ර දි ග පෙණෙන සඳ සඳකැල්මෙන් දිලු නු
ම න ර ග එපුර සඳකාතගෙහඹින් වැඩු නු
සු ර ග ග පතිනිදම් රැකුමෙහි වැනි දුපු නු

55. සුනිල් ඔලා නව්සඳ නිලුපුල් පබ ලූ
විම ල් සීක් ගිජිඳුකුඹු සිරිවැස බැබ ලූ
විපුල් පුලින රඹ සිකිගෙළ මුතු ලද ලූ
ලකල් රණලියන් සරණ බල යහ ලූ

56. ඔ ද වැඩි කෙළිමගුල් ලැබ තුටු නිසාක ල
ස ද සක්මදෙසිනැදූ දෙන දුනුකැන් දුහු ල
සොඳ පුර අඟන පහ සමුගින් පැහැ උදු ල
සෙ ද දුති අඹර මතු ඇය රුස් මිණිමෙවු ල

57. ත ව ර කරු කොකුම් සඳුනෙන් තුනු සිය ල
ප ව ර සුවඳ මල්දම් පැලඳැ මනක ල
බැහැර සිතු නොපැ හිමිනඹුවො කෙළි ලො ල
එ පු ර ඉඳිනි සඳපාණෙන් සඳලුව ල

58. මුවලඹ රඹ වළුබර රන් තැඹිලි තු රු
සැදි ගෙඩුසන් ගෙවමින් වේමග අ තු රු
කරකැවෙමින් දකුණට අවුදින් මි තු රු
වදු වෙහෙරව සිඟිකරු නවගුණම තු රු

59. දිය තෙක් පැතිරු සිටි බුදුගුණ කියා හැ ම
සගමොක් ලබනුවස් පියයුග ඔබා බි ම
සි ය ස ක් පුරා දුටු මෙන් තුටුවැ මුනිතු ම
ව දු ල ක් තිලකගෙයි වැඩඋන් මහපිළි ම

60. පෙර ද ල නිදු දියකාඳ රටබිම් ගල න
සු ර කු ල හිමි රකිණුව ලකා මැවූ ස න
මන ක ල ඒ සමුදුර පැහැයෙන් දිමු න
ව දු ස ල පිළිමගිම් සිරිසරණ සියප න

61. ගි ලි ය නොදී සැට මහණුන් බවමහ ණ
ම ලි ය දෙව්තෙරිදු වැඩහිඳැ දෙසූ බ ණ
දි ලි ය පස්මහල් පායෙහි මිණිකිර ණ
බැලි ය හැකිවිනම් දූසැ වැඳැ යා කල ණ

62. පෙර ඇ විද ගෙණැ ගිරිඳු සිඳු සල ත
නැගිපැහැද පෙණ ස මු ද සැටි තුමු ත
මෙ නාළි ද පැහැ වි හි ද නෙදිගුබ් ත
සැ දි ව ට ද ගෙයි ව දු ද ගැබ දිමු ත

63. දිගුනෙත් නිලුපුලෙව් රතදර පබලර ග
සි රි ම ත් සුපුත්සඳ වැනි උවන මනර ගි
පැහැ පත් ලකල් රන්වන් විලසින් ලොව ග
වැ ද ඔත් පිළිමගිම් වඳු පාශැ පැලදි ග

64. අ හ සි න් අවුත් මිණිඅක්නගිඳු සැදුම ට
ර හ තුන් මැදෙහි මුණි ඉඳැ මිණිපළඟ පි ට
ද හ මු ත් දෙසූ තැනැ කළ සැටරියන් කොට
මහ දගැප් හිමින් වදු සොළොසතැන් සි ට

65. ස ව න සතියැ වැසි වසිනා දසදි ගෙ හි
පෙණින සෙවෙනි මුදලිඳුනා දරන ගෙ හි
ස ව ණ හිඳිනු දනනඳ නා නෙතුසු ගෙ හි
ව දි න මැනවි පිළිමය නා පිළිම ගෙ හි

66. අ ප මුනි දු බුදුවන දිනැ මුරුත් පි ඳු
පැහැවිහි දු දිලි කලඅෙ යටින් යෙ ඳු
සැ දි සිනිඳු ඉඳුනිල්මිණි සතෙක බ ඳූ
වැ දැදුම් දු වන පින්පල ත අත් බ ඳූ

67. ස ස රි න් මුදු ලෙව් සදහම් අ මා දී
එ ක හින් මුනිඳු උන් වැනි නිපර මා දී
ලකුණෙන් සපිරි පිළිමය දූකැ ස මා දී
වැ ද ග න් මිතුර තුන්සිත කරුස මා දී

68. වී ටං ක පැකිළිඳු දකුණස දෙරටුයෙ නී
තිසං ක යෙන් පුද නන් තුරුගොසසම් නී
කලං ක නොවැ කළ සුබලකුණු බබළ ණී
තිවං ක නම් දෙපිළිම නැමදූ බැසග ණී

69. ස ම න්ල ගිරිහීජිදු දිගුකළ සොඬක සැ ටි
සි හි ල ළු ගඟැ සිලිල් සනහා මුනි නොගැ ටි
පැ හැදු ල තුන්සිව්රු ඇඳ පෙරවැ වැඩසි ටි
තැනැකළ සිවුරු දුගැබ වඳු නොපැපි ටි

70. නි රි ඳු න් කැලණිතිස් නිවැරැදි රහත්තැන
සැ ක යෙන් ලැවු හුණුතෙල්සැල තුබූ තැ න
බැ හි යෙන් පිණැහියන් කළ විසිතුරු විම න
වැ ඩ උ න් පිළිමහිමි නමදින් යහදස න

71. පි රි සි ඳැ නොදනහැකි වෙවැඳුම් පින්පඬු රු
මන බැඳැ රුගෙණැ දෙනලෙස දූකැ එසුරවිරු
සු ර ර ද පාය වන් විජයොත් නම් මහ රු
එ ම ස ඳ වඩන රජගෙට මිතුර වැඩක රු

72. පූ ලා සුවඳ මලවුල් කරු වරල් බැ ඳ
දු ලා රන්පතින් සරසා සවන් සො ඳ
නි ලා දිගු නුවන් රසඳුන් තනා ඇ ඳ
බ ලා සිටු රගන රගමඩලැ කල්බ ඳ

73. වි දෙ න ලෙලෙන නරුබර පුළුලුකුළැ රු දී
ගෙ ලන න ග න අතැ නුවනගබැලුම්දී දී
රු ව න දි ලෙ න අබරණකැලුම ගතැ සෙදී
සැලෙන ප හ න සිළු වැනි රගන ලිය සැදී

74. ල ක ළ පුළුලුකුළැ බඳ මිණිමෙවු ල් ලා
ස ම ග රන්සලඹ රුව්දී වෙවු ල් ලා
ව ය න පදට තබමින් පදකම ල් ලා
ර ඟ න ලඳුන් බල රුසිරි සිය ල් ලා

75. වස්දඹු බිඟු කොවුල් වීණානාද මීයු රු
රුස්වූ සෙයින් සත්සර රසඟී සොඳු රු
අස්වන ලියන් දූකෑ ලියකිඳුරඟන යු රු
තොස්කර තසිත සවණත නුවනත මිතු රු

76. මෙ සේ පැවති අනතුරැ ගී රුඟුම්පු ද
තොසේ සිතින් වැඩසිටි සුරවිමනේ මැ ද
ය සේ පතළ දියකුළැ උතුල මන්න ද
ඇ සේ පුරා දකු විබිසණ සුරිඳුස ද

77. පැ මි ණ සිටි අඳුන්ගිරිකුළු මුදුනවෙ ත
රෙහෙණ නැකත ගැලසිරි විලසින් දිමු ත
ස ර ණ මුළුලොවට එසුරිඳු සිරසප ත
ක ල ණ සිරුළ දිසි මුතුලෑල් රුවන්යු ත

78. සුනි ලේ පැහැය හැර සුදුවනුය ගනවෙ ලේ
වි දු ලේ එසින් වියොවට පැමිණි වියවු ලේ
නිස ලේ එ මේසිරි ගත් සුරිඳු හැමක ලේ
උ දු ලේ දෙහෝ රන්පට මෙන් නලල්ත ලේ

79. රු වි නේ උතුම් එසුරිඳු මිණිර්ල මෙ නේ
ස ව නේ රුඳුනු රසුදුල තෝඩු ගණර නේ
උ ව නේ වැජඹි සිරිසරසවිය හැමදි නේ
සො බ නේ කනා කැටපත් යුවල විලසි නේ

80. න ම ක ළ ස තහැලේ සිහිලේ සැපසිලි ලී
බියසෙන රුපු කැලේ තුමුලේ දෙන තොකලී
නලළත ගිරි තෙ ලේ සුනිලේ රුසිතිපි ලී
සුරරද දෙ බැම ලේ ගනලේ සිරි කිය ලී

81. ස තු රු සුර අඳුරු එකපැහැර දුරුක ළු
මී තු රු තඹුරු වන නිරතුරු පුබුදුක ළු
අ තු රු තුසර සිඳුවන දූකුමෙන් පහ ළු
ල හි රු සිරින් දිලිහිණි හිමි නෙත් සඟ ළු

82. ය ස ගා නකළ තැනැ තැනැ සිඳගනන්සැ දි
නොලගා එනිම් දිගුතුගු නැගැයට වොරැ දි
ස ම ගා රදුන් දෙවියන් සෙව්මින් තිසැ දි
මු ර ගා අහෝ මිණිකාලම වෙහෙස ඩි දි

83. සි රි ස රු හිගුල්විලෑ සේහසටැලෙවී ග න
සු ර ව ර සුලෙල රතලවනන දළ දූල න
ම න හ ර සඳවලාපෙළ කෙළවර පෙණෙ න
පැහැසර ළසඳ සුවලෙක් ඇත්නම් එමෙ න

84. ඝ නා මිණිවලලු නැගි රැස් මල්කැනැ ති
ම නා දිගු ඇඟිලි නවතඹ ලපලු ඇ හි
ද නා කැමති දෙන පලඹන එසුරප හි
දි නා දිමුතු අතුසිරි සුරතුරු පැව ති

84. පා නා සෙනෙහෙ සසිනිදු මදලස බැ ල් ම
ගා නා නිමහනෙව් දෙවඟන නෙත්කැ ල් ම
නා නා සුරිදු පුළුලුර සිරිසඳ ඇ ල් ම
නු නා කෙළින ගලතල වැනි ඉඳුනි ල් ම

86. ල කු එ පුළුලුකුළ වටබිමැ එසුරව් රු
වෙ ර එ මිණිකැලුම් පතරින් මෙවුලතු රු
නැ බු ලු සොඳුරු සුසිලිටු වටොර රඹතු රු
බැ බ ලු සිලිල් ඉසිනා විලස සිරි දූ රු

87. ව ඳ නා සුරන් කිරුළග රුවනකැලුමෙ නා
බ ඳ නා කොමල ලතුව්ලසල රතින් ම නා
ම ඞ නා බැවින් සියපත් එහිම් පතුලෙ නා
බි සෙ නා ලතඹු හෝපලු සදිසි වෙව්ල නා

88. වෙසෙසින් පහන් පැහැසර ගැඹුරු පිවිතු රු
බැ ලු ව න් ඇලුම්කරවන යලිදු බියක රු
සි රි පි න් රුවන් පිරි එසුරිඳු සයුරු යු රු
මු ව කි න් කියා නිමවිය හැකිද රූසි රු

89. ලෙව් හට තමන් නම කිව රිසි දෙනව් සි නී
දෙව් තුරු සුරබි සුරම්ණි සරිද කෙලෙ සි නී
ප ව් රෝදුක් දුරුරලනා පොකුරඹ ලෙ සි නී
දෙව් වෙද ඇසෙන පමණෙකි වියතුන්බ සි නී

90 ම න් පිණවනා යසසිරි තෙද නැණ විපු ල
සෙන් යුද ජය රජබව තනතුරු සිය ල
දෙ න් නෙන් පැතුව්ට සුබවැඩ දියාබ ල
පි න් නම් සත කළ දෙව්රජමය මෙකා ල

91. තුන් ලෝ තමා නතුකළ රවුළු සොහොවු රු
තුන් කල් බලා රම්දුට වූ ඉටුම්තු රු
තුන් වේ ඇදුරු පුලනිසිකුල මිණිම්තු රු
තුන් විටකම වඳුව එසුරිදු පාතඹු රු

92. අනතුරු බලා අදහස අවසර විග ස
සුහුසුලුනොවී සලකා පසු පළමු බ ස
පෙරදූරිකොටම සුරිඳුට තියුවදන්ගො ස
සැලකර තගිය කටයුතු සිටෑ එකත්ප ස

93. ත ර ස ර සුනෙර තදතෙද දිමුතු දිවයු ර
පු ව ත ර ගැ ඔර සමුදුර කැලුම නිලඹ ර
සො ම් බ ර ප ව ර නිසයුරු නුවණ සුරගු ර
සු ර ව ර සැ ර ද විබිසණ නම් කැළණිපු ර

94. ර ජ කු ල සුපුල්විලැ රජහස වන් සර ණ
පෙ ර ම ල වියා වන් රුසිරෙන් මනනඳ න
හැ ම කා ල විපුල සව්සැපතින් නොඅඩුව න
තෙ ද බ ල විකුම් ගුණමිණිබරණින් තෙවු න

95. ග රු ත ර නල්ලූරුතුනයා නමැති මැ ති
සි හි ක ර නිතර මහපුද පඬුරු දී රු ති
නො පිසිර ඔබට දන්වනලෙස කී සිතැ ති
සු ර ව ර මදක් කල් එපවත් ඇසියයු ති

96. රි වි කු ල ලමැණිගොත් පිරිසිදු ගුවන් මැ ද
පැ හැ දු ල සරාකල් පත් සහසකර බ ද
කි වි කැ ල ගෙලට මුතුහර වන් යසපබ ද
සි රි කා ල කුලනිවෙස් දිය පතළ තදතෙ ද

97. හ ළ දුසිරිතත් දූනැ තෙවළා මුනිඳුබ ණ
කෙ ළ පත් සියල් අවිසිප් කිවිනළු සත ණ
ඔ ළ ඉමොළ රූපුන් දප මැඩැ පැ උපා නැණ
කා ළ මුළු මෙලක්දිව එකසේසත් සෙව ණ

98. සත නෙත දුන් රූසිරි රස අ ඳු න් වන
පත නරලොව පුරඳුරු සිරි අ ඳු න් වන
විකුමෙන් දඹදිවැ නිරිඳුන් මු දු න් වන
අප පැරකුම් නිරිඳුට දූල ඳු න් වන

99. සි රි ස ඳ ව න් සව්සිරි දියුණුවැ රඳ නා
සිතුම් ණ ව න් යදි යදිනට දනින් දෙ නා
ස ර ස වි ව න් නුවණින් පහළවැ පෙණෙ නා
න ව ස ඳ ව න් ලෙව්වැසි අදරින් වඳි නා

100. යෙහෙළින් කෙරේ සකිසැප සමග සි ත් මේ
කුළුණෙ න් දූසිදසුන් වෙතැ වසින ව ත් මෙ
ර කි ම න් පතිනිදම් යහපත් සිරි ත් මේ
සිහි නෙ න් නිපන් වැනි දසපින් පැවැ ත් මේ

101. මි හි රි තෙපලැ තන්වැසි කිවිකම් පුරු ඳු
ඉ ති රි බැතිපෙමැති පෙළදහමෙහි මුනි ඳු
නොහැරි පෝයැ අටසිල් රැකුම පිරිසි දු
සැ සි රි උලකුඩය දේවිහට පසි ඳු

102. දි ත් රුපු සිළු මල්දම් සුවඳ මී වැ ස
නෙත් සිරිපා යුත් සුරිඳුනි තිලෝඇ ස
ධි ත් ක්‍ෂණවන ඇති ආසිරි නුවණ ය ස
පු ත් රුවනක් සොඳ දුන මැනවි නිසිලෙ ස

103. බි ස ව ට පළමු රත්නාවලි නම් සොඳු රු
ස හ තු ට දෙවූ හිමි දිවැසින් කුළුණු පි රු
මෙ ල ක ට ඉසුරුවී පැරකුම් රජකුම රු
ප ළ කො ට කිමෙක ඔබ සොඳ තෙදබලමහරු

104. එසෙයින් දූසමන් මහුනෙල් කුසුම් ගෙ න
පුද මි න් එසුරවර සිරිසරණ වඳිමි න
බුහු ම න් කාරණ රජදූසළුට මෙකිය න
දුන පි න් සමග යසසිරි වඩි පුත්රුව න

105. මෙහසුන් සුරිඳුහට සැලකර මෙ සේ යා
ව ඳි මි න් බැතින් පැදකුණුකොට නොසේයා
ද කි මි න් බිසෝ දෙවියන් නොවල සේ යා
කි ය මි න් යදින් සකිසඳ මෙම ලෙ සේ යා

106. පැ හැ ප ත් පුන්සඳෙව් කිරිසමුදුරැ පළ ට
සිය ගො ත් බබුලුවන දෙවුරජ කුමරහ ට
නැ ව ත ත් එකලාව අවසර ලැබුනු වි ට
මෙ ප ව ත් කියව සැලකරනුව සුරරදු ට

107. මේ සියලුම අදහස කුළුණෙන් ගිහි ණි
සේසිය පතක් සලසා උදයෑ දිනම් ණි
නෑසිය ඉටුමිතුරු සමගින් සැළලිහි ණි
වාසිය පවතු සිතුලෙස සැපනින් පැමි ණි

---

පැ ර කු ම් රජුට පන්තිස්වන නවම්ම ස
ම න ර ම් කර බඳුතු මෙහසුන් නොවීල ස
අ ය දු ම් ලෙසට සිදුකරැ කිවිදු අදහ ස
දෙ වී ර ම් මිතුරු දූනි ගැබ බිසවට සක ස

ස ති ස් වන නවයෑ පුර අස්ලිස නැක ත
ප හ ස් ලැබ සුපුන්සඳ තුබතුරු පෙණෙ න
ස හ ස් කර කුලට වැඩවනලෙස [illegible] න
මෙ සෙස් රජකුමර පිලසින් දූකුම්ප ත

ක ඳ වු රූ, කුල මැදුරැ මිණිපහනෙව් සුසැ දී
නැණ ගු රූ සබස සමයද දූනුමෙන් වොරැ දී
ර ජ ගු රූ විජයබාපිරිවන් හිමි පැහැ දී
මෙ මි යු රූ පදූනි සැළලිහිණිය අස්නා යෙ දී

දු ච නා බඳ කිකිණි හයකුර පහර් න ද
සු ච නා තල්නිනද ගිජිඳුන් සෙමෙර බ ද
ර ච නා නොයෙක තුරූ ජයසක් හඬ නොම ද
දේච නා මුහුදමෙන් ගුම්ගනි පුර නිබ ද

නිමි.

---

# දැන්වීමයි.

---

"සැලලිහිණිසන්දෙශය" නාම් මෙම මධුරමනොහර කාව්‍යය විජයබාහු පරිවෙණාධිපති ෂඩ්භාෂා පරමෙශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය ශ්‍රීරාහුල සඞ්ඝරාජ මහාස්වාමිපාදයන්වහන්සේ විසින් කරණලද්දකි. මෙම රටේ බොහෝ කලකපටන් පණ්ඩිතයන් විසින් ගරුබුහුමන්කරණ වැදගත් කාව්‍යයක්බැව් කව්රුත් දන්නාහෙයින් ග්‍රන්ථවර්ණනාවගැණ අපි නොපවසෙමු.

මේවූකලී මීටඉහත කීපවාරයක්ම මුද්‍රණයකොට ඇත්තේනමුත් ඒ සියලුවාරවලම සන්නසහිතව මුද්‍රණයකර තිබෙනබැවින් අර්‍ථහදුරවා ගන්න ඇතම් ආධුනිකජනයා පාඩම්දෙන අවස්ථාවන්හිද සන්නයම භාවිතාකිරීමෙන් අර්‍ථධාරණයෙහි අසමර්‍ථව වසනබැව් දැනගත් කීපදෙනෙකුගේ ආයාචනාවෙන් ආධුනික ජනානුකම්පාපිණිස මෙසේ පෙළ පමණක් මුද්‍රණයකරවූයෙමු.

මේවගට,

**W. E. PERERA.**